සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/ HO /09/ CBO/ කොඩ් | ඔබේ අංකය / உமது இல / Your No: ............ | දිනය / திகதி / Date: 2017.05. 25 |

සමෘද්ධි චක්‍ර ලේඛ :- **ප්‍රජාමූල/02/2017/03**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියළුම සම්බන්ධීකරණ නිලධාරීන්,

සියළුම සමෘද්ධි කළමනාකරුවන්,

සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරීන්,

සියළුම සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානවල සභාපතිවරුන් හා ලේකම්වරුන්,

සියළුම සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල සභාපතිවරුන් හා ලේකම්වරුන්.

## ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දිනය -2017 මැයි 31

**" දුසිරිත දුරලමු නිති සතුට සදමු. නිරෝගී දැයක් බිහි කරමු "**

### 01. හැඳින්වීම

2013 අංක 01 දරන සමෘද්ධි පනතට අනුව "ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමෙහි ලා සහ දිළිඳු බව තුරන් කිරීමේ සහ සමාජ සාධාරණත්වය සහතික කිරීමේ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කිරීමෙහි ලා පුද්ගල, පවුල, කණ්ඩායම් සහ ප්‍රජාව කේන්ද්‍ර කර ගත් ජීවනෝපාය සංවර්ධන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම " සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වේ. මෙම අරමුණ මුදුන්පත් කර ගැනීමේ දී සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන වලට සුවිශේෂී කාර්ය භාරයක් හිමිවේ.

www

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya ,Battaramulla

Tel- / Fax - / E-mail-

| | | | | |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (මානව සම්පත්) / பணிப்பாளர் (மனிதவளம்) / Director (Human Resource) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
| 011-2873802/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 011-2887280 |
| 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | Hot Line: 011- 2887722 |
| dg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | finance@divineguma.gov.lk | Hot Line:0112-885582 | |
| | Hot Line : 0112-889007 | | | |

2013 අංක 01 දරන සමෘද්ධි පනතේ 10 (ඒ) ඡේදයට අනුව,

i. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ආත්ම විශ්වාසය,සමාජය කෙරෙහි සාමුහික වගකීම,යහපත් ගුණාංග හා ගුණධර්ම ප්‍රවර්ධනය කිරීම ප්‍රජාමූල සංවිධානවල එක් පරමාර්ථයක් වන අතර

පනතේ 16 (ඉ) ඡේදයට අනුව,

ii. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ මානව පෞරුෂය,සාමුහික ක්‍රියාකාරකම්,දැහැමි හා ආධ්‍යාත්මික ගුණාංග වැඩි දියුණු කිරීම. සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන වල එක් පරමාර්ථයක් වේ.

මෙම පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන එක් වැඩ සටහනක් ලෙසින් මෙවර 2017 මැයි 31 දිනට යෙදී ඇති ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දිනය මූලික කර ගනිමින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරන කොඩි දිනයට අදාළ වැඩ පිළිවෙල සඳහා අවශ්‍ය උපදෙස් මෙම චක්‍ර ලේඛය මගින් ලබා දෙනු ඇත.

## *02. ක්‍රියාත්මක වන ආකාරය*

i. මුද්‍රණය කරන ලද කොඩි, ස්ටිකර්,කැට ලේබල් හා පෝස්ටර් 2017 මැයි 26 දින වන විට සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට විධිමත් පරිදි ලැබීමට සලස්වනු ඇත. දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සිටින ප්‍රජාමූල සංවිධාන හා සමාජ සංවර්ධන විෂය භාර නිලධාරීන් විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන්කරන ලද කොඩි,ස්ටිකර්,කැටලේබල් හා පෝස්ටර් එක් එක් මූලස්ථාන සමෘද්ධි කළමනාකරු හෝ සමාජ සංවර්ධන සහකාර නිලධාරීන් වෙත 2017 මැයි 29 දිනට ප්‍රථම විධිමත් ලෙස භාර දිය යුතුයි.

ii. සියළුම මූලස්ථාන සමෘද්ධි කළමනාකරුවන් හා සමාජ සංවර්ධන සහකාර නිලධාරීන් විසින් අවශ්‍ය පරිදි කොඩි, ස්ටිකර්,කැටලේබල් හා පෝස්ටර් සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරු හා කලාප සහකාර ලෙස කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් මගින් 2017 මැයි 30 දින සියළුම වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත විධිමත් ලෙස භාර දිය යුතුයි.

iii. සියළුම වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් සපයා ඇති කැට ලේබලය අලවා සීල් තබන ලද ආරක්ෂිත කැටයක් සකස් කර ගෙන තම වසමට අයත් ප්‍රජාමූල සංවිධාන වල සභාපති,ලේකම් හා භාණ්ඩාගාරික ඇතුළු විධායක සභාව

මෙන්ම සාමාජිකයන් සමග එක්ව එම සමෘද්ධි ප්‍රතිලාභීන් මගින් කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් හා දුම්වැටි හා මත් ද්‍රව්‍ය භාවිතයෙන් වැලකී සිටීමේ පණිවිඩය ජනතාව වෙත ලබා දෙමින් අරමුදල් රැස් කිරීමට කටයුතු කළ යුතුයි.

iv. කොඩි හා ස්ටිකර් පිළිගැන්වීම මගින් අරමුදල් රැස් කිරීම 2017 මැයි 31 දින පෙ.ව 8.00 සිට 2017 ජුනි 30 දින පෙ.ව.11.00 තෙක් පමණක් සිදු කළ යුතුය.

v. කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමේ දී කිසිම හේතුවක් මත සමෘද්ධි ප්‍රතිලාභීන්ගෙන් හා ප්‍රජාව ගෙන් බලහත්කාරයෙන් මුදල් එකතු කිරීම සිදු නොකළ යුතුය.

vi කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් " ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනය" ප්‍රජාව අතර සිහිපත් කරමින් සමෘද්ධි ප්‍රතිලාභීන් මෙන් පොදු මහ ජනතාව දුම් වැටි හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් මුදවා ගැනීමේ මුඛ්‍ය පරමාර්ථය උදෙසා මෙම කාර්ය සිදු කළ යුතුයි.

Vii කොඩි හෝ ස්ටිකර් මහජනතාව වෙත පිළිගැන්වීමෙන් රැස් කරන මුදල් ප්‍රදේශයේ සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ සමාජ සුභසාධන කටයුතු සඳහා පමණක් වැය කරන බව මහජනතාව වෙත දැනුම් දීමට ද කටයුතු කළ යුතුයි.

Viii. කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් රැස් කරන ලද මුදල් සීල් තබන ලද කැටයට පමණක් බහාලිය යුතු අතර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු කිසිදු නිලධාරියෙකු මුදල් රැස් නොකළ යුතුය. ප්‍රජාමූල සංවිධානවල සාමාජිකයන් වුවද අවිධිමත් ලෙස මුදල් රැස් කිරීම හෝ ලේඛනයක සඳහන් කර මුදල් රැස් කිරීම නොකළ යුතුයි. යම් පරිත්‍යාගශීලී ප්‍රභූවරයෙක් හෝ ධානපතියෙක් ඉහල වටිනාකමකින් යුත් මුදලක් ලබා දෙන්නේ නම් එය අදාළ ප්‍රජාමූල සංවිධානයේ බැංකු ගිණුමට බැර පිණිස ලියන ලද චෙක් පතක් මගින් හෝ ක්ෂේත්‍රයේ දී මුදල් භාර ගැනීම බැර පතක් (ලදුපතක්) වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් නිකුත් කිරීමෙන් පමණක් එම මුදල් භාර ගත යුතුයි.

.

***03. එක් රැස් කළ මුදල් තැන්පත් කිරීම හා වාර්තා කිරීම.***

i. කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් මුදල් රැස් කිරීම 2017 ජුනි මස 30 දින පෙ.ව.11.00 ට අවසන් කළ යුතු එදින පෙ.ව.11.00 සිට ප.ව. 1.00 දක්වා මුදල් බහාලන සීල් තබන ලද කැට ප්‍රජාමූල සංවිධානයේ සභාපති හෝ ලේකම් සහ භාණ්ඩාගාරික විසින් වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී වෙත අදාළ සමෘද්ධි ප්‍රජාමූල බැංකු පරිශ්‍රයේදී භාර දිය යුතුයි.

ii. වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් ප්‍රජාමූල සංවිධානයේ සභාපති හෝ ලේකම් හා භාණ්ඩාගාරික මෙන්ම කලාප සහකාර ලෙස කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිලධාරී හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරු ඉදිරියේ දී මුදල් බහාලන සීල් තබන ලද කැට විවෘත කළ යුතුයි.

iii. ඉහත 03 ii හි සඳහන් සියළුදෙනා ඉදිරියේදී ගණනය කරන ලද මුදල් විධිමත් පරිදි ලේඛනයක සඳහන් කර ඊට වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී සහ ප්‍රජාමූල සංවිධානයේ භාණ්ඩාගාරික විසින් අත්සන් තැබිය යුතුයි.

iv. රැස් කළ මුදල් ප්‍රජාමූල සංවිධානයේ භාණ්ඩාගාරික විසින් තම සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය නමින් සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ ආරම්භ කරන ලද සාමාජික නොවන ඉතිරි කිරීමේ ගිණුමට බැර කළ යුතුය.

v. සියළුම ප්‍රජාමූල සංවිධාන වලින් මුදල් බහාලන සීල් තබන ලද කැට සියල්ල විවෘත කර මුදල් තැන්පත් කළ පසු ඉහත 03 iii හි පරිදි සකස් කරන ලද ලේඛනය කලාප සහකාර ලෙස කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිලධාරී හා බැංකු කළමනාකරු ලෙස කටයුතු කරන සමෘද්ධි කළමනාකරු විසින් අත්සන් තැබිය යුතුය. මෙහි මුල් පිටපත මූලස්ථාන සමෘද්ධි කළමනාකරු වෙත යැවිය යුතු අතර ඡායා පිටපතක් බැංකුවේ ගොනු කර තැබිය යුතුය.

vi. සියළුම ප්‍රජාමූල සංවිධාන වෙතින් තැන්පත් කරන ලද කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් රැස් කරන ලද මුදල් පමණක් එක් එක් ප්‍රජාමූල සංවිධානයේ සභාපති හා භාණ්ඩාගාරික ගේ ලිඛිත ඉල්ලීමකට අනුව ප්‍රාදේශීය සංවිධානය නමින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියේ ආරම්භ කර ඇති සාමාජික නොවන ඉතිරි කිරීමේ ගිණුමට බැර පිණිස ලියන ලද චෙක්පතක් මඟින් 2017 ජුලි 05 දිනට ප්‍රථම යැවිය යුතුයි.

vii. එක් එක් සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරුවන් විසින් තම සමෘද්ධි ප්‍රජාමූල බැංකු වෙතින් ලද චෙක් පත් සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානය නමින් සාමාජික නොවන ඉතිරි කිරීමේ ගිණුමට තැන්පත් කිරීමෙන් පසු එක් එක් බැංකුවක් විසින් තැන්පත්

කරන ලද මුදල් සඳහන් කරමින් තහවුරු ලිපියක් මූලස්ථාන සමෘද්ධි කළමනාකරු වෙත යැවිය යුතුයි.

viii. මූලස්ථාන සමෘද්ධි කලමණාකරුවන්ගේ අධීක්ෂණය යටතේ සමාජ සංවර්ධන සහකාර ලෙස කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් සමෘද්ධි බැංකු කලමණාකරුවන්ගෙන් ලද එක් එක් ප්‍රජාමූල සංවිධානයෙන් රැස් කරන ලද මුදල් ඇතුළත් ලේඛනයේ එකතුව හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කලමණාකරු විසින් එවන ලද තැන්පත් රැස් කිරීමේ තහවුරු ලිපියේ සඳහන් අගය සමඟ සමාන වන්නේ දැයි පරීක්ෂා කර ප්‍රාදේශීය ලේකම් ගේ අත්සනින් යුත් ආවරණ ලිපියක් සමඟ කලාප මට්ටමින් එක් රැස්වූ මුදල් පිළිබඳ ලේඛනයක් 2017ජුලි 10 දිනට පෙර දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත යැවිය යුතුයි.

ix. දිස්ත්‍රික්කයේ ප්‍රජාමූල සංවිධාන හෝ සමාජ සංවර්ධන විෂය භාර නිලධාරී විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් ලැබෙන කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් එක් රැස් කළ මුදල් ඇතුළත් ලේඛන පරීක්ෂා කර නිවැරදි බවට තරවුරු කර ගැනීමෙන් පසු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දිස්ත්‍රික් ලේඛනය සකස් කර දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ අත්සනින් යුත් ආවරණ ලිපියක් සමඟ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රජාමූල සංවිධාන අංශය භාර අධ්‍යක්ෂ වෙත 2017 ජුලි 15 දිනට ප්‍රථම යැවිය යුතුයි.

## ***4. උත්සව හා විශේෂිත වැඩසටහන්***

i. ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දිනය දිවයිනේ සෑම පුරවැසියකුටම අවබෝධ වන පරිදි සිහිපත් කිරීම සඳහා විශේෂිත උත්සව හා වැඩසටහන් සංවිධානය කල යුතු වේ.

ii. සෑම ග්‍රාම නිලධාරී වසමක් ම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් 2017 මැයි 31 දින පෙ.ව 11.00 ට ප්‍රථම විශේෂිත උත්සවයක් තම කාර්යාලය අභියස සංවිධානය කළ යුතු අතර එහි දී ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් සිටින ආගමික නායකයින්,ප්‍රභූවරුන්,රජයේ නිලධාරීන් හා ප්‍රජාව සම්බන්ධ කර ගත යුතුයි.

iii. සෑම සමෘද්ධි ප්‍රජාමූල බැංකුවක්ම ආවරණය වන පරිදි කලාප සහකාර ලෙස කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් තම බැංකු පරිශ්‍රය තුළ 2017 මැයි 31 දින පෙ.ව.11.30 ට ප්‍රථම විශේෂිත උත්සවයක් සමෘද්ධි ප්‍රජාමූල බැංකු කලමණාකරු ගේ අධීක්ෂණය යටතේ සංවිධානය කළ යුතුයි.එහිදී ආගමික නායකයින්, ප්‍රභූවරුන්,රජයේ නිලධාරීන් හා ගණුදෙනුකරුවන් සම්බන්ධ කර ගත යුතුයි.

iv. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය මත මූලස්ථාන සමෘද්ධි කලමණාකරුගේ හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කලමනාකරුගේ අධීක්ෂණයෙන් යුතුව සමාජ සංවර්ධන සහකාර ලෙස කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් 2017 මැයි 31 දින පෙ.ව. 11.30 ට ප්‍රථම විශේෂිත උත්සවයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේ දී හෝ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති ගොඩනැගිල්ල පිහිටි පරිශ්‍රය තුළ දී සිදු කළ යුතුයි. එහිදී ආගමික නායකයින්, ප්‍රභූවරුන්,රජයේ නිලධාරීන් හා ප්‍රජාව සහභාගී කර ගත යුතුයි.

v. සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයක් තුලම දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය මත දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ අධීක්ෂණයෙන් ප්‍රජාමූල සංවිධාන හා සමාජ සංවර්ධන විෂය භාර නිලධාරීන් විසින් විශේෂිත උත්සවයක් 2017 මැයි 31 දින පෙ.ව.11.30 ට ප්‍රථම සංවිධාන කළ යුතුයි. එහිදී ආගමික නායකයින්, ප්‍රභූවරුන්,රජයේ නිලධාරීන් හා ප්‍රජාව සහභාගී කර ගත යුතුයි.

vi. ඉහතින් දැක්වෙන පරිදි ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු මට්ටමින්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් පවත්වන ලද විශේෂිත උත්සවයේ දී දුම්වැටි හා මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව හා ඉන් වැළකී සිටීමෙන් ලැබෙන මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ පිළිඳව දැනුවත් කිරීමක් සිදු වන පරිදි දේශන පැවැත්වීමට සැලසුම් කල යුතු වේ.

vii. ඉහතින් සඳහන් කළ පරිදි අදාළ උත්සව අවසානයේදී එක් එක් කාර්යාල පරිශ්‍රය පිහිටි ප්‍රජාමූල සංවිධාන බල ප්‍රදේශයේ සාමාජිකයින් කිහිප දෙනෙකු කැඳවා ඔවුන් මඟින් කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් මුදල් රැස්කිරීමට කටයුතු කළ යුතු වේ.

viii. 2017 මැයි 31 දින ජාත්‍යන්තර දුම්වැටි හා මත්ද්‍රව්‍ය විරෝධී දිනය සිහි ගන්වමින් උත්සව පවත්වන අවස්ථා වලදී හෝ ඊට පසු අවස්ථා වලදී (2017 ජුනි 30 දිනට ප්‍රථම) වීදි නාට්‍ය, චිත්‍ර ප්‍රදර්ශන, පෝස්ටර් ප්‍රදර්ශන, පාගමන් වැනි විශේෂිත වැඩසටහන් සෑම ප්‍රජාමූල සංවිධානයක් විසින් සංවිධානය කළ යුතුය.

ix. ඉහත 04 (viii) හි සඳහන් විශේෂිත වැඩසටහන් අතුරින් හොඳම වැඩසටහන සමෘද්ධි ප්‍රජාමූල බැංකු (කලාප) මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරා ඇගයීමකට ලක් කිරීමට පියවර ගත යුතු අතර මේ සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ උපදෙස් මත මූලස්ථාන සමෘද්ධි කළමනාකරු හා සමාජ සංවර්ධන සහකාර විසින් සුදුසු වැඩ පිළිවෙලක් සංවිධානය කළ යුතු අතර තෝරාගත් හොඳම විශේෂිත වැඩ සටහන් ප්‍රාදේශීය මට්ටමින් නම්කර දිස්ත්‍රික් මට්ටමින් ලේඛනයක් සකස් කර දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රජාමූල සංවිධාන අංශය භාර අධ්‍යක්ෂ වෙත එවිය යුතුය.

x. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම හා සෑම සමෘද්ධි බැංකුවක් ආසන්නයේ පෝස්ටරයේ සඳහන් වගන්ති ඇතුලත්ව නිර්මාණශීලීව සකස් කරගත් බැනරයක් ප්‍රදර්ශනය කිරීමට කටයුතු කළ යුතුය.

xi. 2017 මැයි 31 සිට 2017 ජුනි 30 දක්වා ජාත්‍යන්තර දුම්වැටි හා මත් ද්‍රව්‍ය විරෝධී දිනය වෙනුවෙන් පවත්වන උත්සව හා විශේෂිත වැඩසටහන් වෙනුවෙන් වැය වන වියදම් සඳහා මුදල් ප්‍රාදේශීය ලේකම්ගේ, දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතියෙන් ප්‍රාදේශීය මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් ඇති සමාජ සංවර්ධන අරමුදලින් ලබාගැනීමට මෙයින් අවසර දෙනු ලැබේ.

## *5. ඇගයීම් ක්‍රමය*

i. ප්‍රජාව වෙත කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් රැස්කල වැඩිම මුදල් ප්‍රමාණ සැලකිල්ලට ගෙන ඇගයීමට ක්‍රමවේදයන් සමෘද්ධි ප්‍රජාමූල බැංකු (කලාප) මට්ටමින්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් ද ඇගයීමට ලක් කරනු ඇත.

ii. සෑම සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවෙකු විසින්ම සෑම බැංකු කලාපය තුළ පිහිටි සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන අතුරින් වැඩිම මුදල් ප්‍රමාණයක් රැස්කල ප්‍රජාමූල

සංවිධානය හා මුදල සඳහන් කරමින් මූලස්ථාන සමෘද්ධි කලමණාකරු වෙත 2017 ජුලි 05 දිනට ප්‍රථම ලිඛිතව දැන්විය යුතුය.

iii. සෑම මූලස්ථාන සමෘද්ධි කළමණාකරුවෙකු විසින්ම තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සමෘද්ධි ප්‍රජාමූල බැංකු ප්‍රජාමූල බැංකු බල ප්‍රදේශයේ (කලාප) තුල වැඩිම මුදලක් රැස්කල ප්‍රජාමූල සංවිධානය හා මුදල සඳහන් කරමින්, එක් එක් සමෘද්ධි ප්‍රජාමූල බැංකුව වෙත තැන්පත් පිණිස ලද මුළු මුදල ද සඳහන් කරමින් ලේඛනයක් සකස් කර දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත 2017 ජුලි 10 දිනට ප්‍රථම යැවිය යුතුයි .

iv. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රජාමූල සංවිධාන විෂය භාර නිලධාරී හා සමාජ සංවර්ධන විෂය භාර නිලධාරී මගින් තම දිස්ත්‍රික්කය තුළ කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් වැඩිම මුදල් ප්‍රමාණයක් රැස්කළ ප්‍රජාමූල සංවිධානය ( බැංකු කලාප මට්ටමින්) සමෘද්ධි ප්‍රජාමූල බැංකුව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අදාළ මුදල සමග සඳහන් කරමින් ලේඛනයක් සකස් කර දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරයාගේ ලිපියක් සහිතව 2017 ජුලි 15 දිනට ප්‍රථම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රජාමූල සංවිධාන අංශය භාර අධ්‍යක්ෂ වෙත එවිය යුතුය.

ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනය සංකේතවත් කරමින් කොඩි සහ ස්ටිකර් පිළිගැන්වීමෙන් වැඩිම මුදල් ප්‍රමාණයක් රැස් කරන ප්‍රජාමූල සංවිධානය හා ඊට දායකත්වයක් සපයන වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, කලාප සහකාර ලෙස කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, බැංකු කලමනාකරුවන් ලෙස හා බැංකු සමිති කළමනාකරුවන් ලෙස කටයුතු කරන සමෘද්ධි කළමනාකරුවන්, සමාජ සංවර්ධන සහකාර නිලධාරීන්, මූලස්ථාන සමෘද්ධි කළමනාකරුවන්,ප්‍රාදේශීය ලේකම්වරුන් සහ දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂකවරුන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් ඇගයීමකට ලක් කරමින් සහතික පත් කුසලාන හා ත්‍යාග පිරිනැමීම මෙන්ම තෝරාගත් කණ්ඩායමක් සඳහා විදේශ සංචාරයක් ලබාදීමටද කටයුතු කරනු ඇත.

**සටහන :-**

කොඩි හා ස්ටිකර් පිළිගැන්වීමෙන් රැස්කරන මුදලින් ගොඩනැගෙන අරමුදල භාවිතා කර සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ සුභසාධන කටයුතු සඳහා වැය කළ යුතු ආකාරය දැක්වෙන චක්‍රලේඛය ඉදිරියේදී නිකුත් කරනු ඇත.

**පැහැදිලි කර ගැනීම :-**

මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍යවන්නේ නම් නොපැකිලිව ප්‍රජා මූල සංවිධාන අංශය භාර නියෝජ්‍ය අධ්‍යක්ෂ ඇමතිමට කාරුණික වන්න.
( දුරකථන අංකය - 011 2873794 )

**නීල් බණ්ඩාර හපුහින්න,**
අධ්‍යක්ෂ ජනරාල්
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

පිටපත් :-
01. සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍ය ගරු එස්.බී. දිසානායක මැතිතුමා -කා.දැ.ස.
02. සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍ය ගරු රන්ජන් රාමනායක මැතිතුමා -කා.දැ.ස.
03. ලේකම්, සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය -කා.දැ.ස.
04. අතිරේක ලේකම් - සංවර්ධන - සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
05. අතිරේක ලේකම් - පාලන- සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
06. ප්‍රධාන ගණකාධිකාරි - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ස /අ.ක.ස
07ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ස
08. සියළුම අධ්‍යක්ෂවරුන් - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ස